පන්හිඳයි පින්සලයි

සිසිර දිසානායක

"ඕගොල්ලං එක්ක වැඩ කරන කෙනෙක් හොඳ වැඩකට අත ගහල තියෙන්නේ ..... ?" ගිය මාසෙ "සන්නස" පත්තරේ පෙරළන ගමන් පින්සල, පැන්සලගෙන් ඇහුවා.

"අත ගහලා නෙවෙයි; කරගහලයි තියෙන්නේ. කොටින්ම කිව්වොත් අවංකවම වැඩේට බැහැලැයි තියෙන්නේ...." පැන්සලත් පත්තරේට මූණ පෙව්වා. හතළිස් තුන්වෙනි පිටුවේ තියෙන පින්තූර දැකලා දෙන්නගෙ ම ඇස්වල කඳුළු.

"ඔවුනට ඔබේ පිහිට අවශ්‍යය," සුමේධා පරණවිතාන මිස්ලා තේජා පෙරේරා මිස්ලා එකතු වෙලා කරන අගේ ඇති වැඩේ ගැන පත්තර පිටුව පිරිලා. රසිකා, නයනා මිස්ලත් මේ වැඩේට එකතු වෙලා.

"ඔන්න වැඩ ! ඔන්න මනුස්සකම් !!" කොහේදෝ ඉදං පන්හිඳත් එතනට පාත් වෙච්චි !" "දැන් මොකද වෙන්නේ "

පැන්, පන්, පින් දෙන්නව දැනුවත් කරන්න හරි බරි ගැහුනා. "දරු පැටියව මුළු පවුල ම එක්ක කොළඹ ගෙන්නගෙන දවස් කීපයක් නවත්තාගෙන සංජීව ගරුසිංහ ස්නායු විශේෂඥ දොස්තර මහ-ක්කයාට පෙන්නලා තියෙනවා. " ඇපලෝ" ඉස්පිරිතාලෙදියි පරීක්ෂා කරලා තියෙන්නේ. දොස්තර මහත්තයා කියන හැටියට දරුවගේ මොළයේ වතුර එකතු වෙනවලු. ඉතින් මේ විදියට ගියොත් වැඩි දවසක් යන්න කලින් ඇස් අන්ධ වේවිලු. ඊට පස්සේ ජීවිතයට වුණත් හානි වෙන්න පුළුවන්ලු. ඕකට කරන්න තියෙන්නේ ස්ථිරව බටයක් ඇතුල් කරලා විටින් විට වතුර අයින් කරන එකලු. ඉතින් හොඳම ආර-ක්ෂාකාරීම විදියට කරන්න රුපියග් ලක්ෂ පහක් විතර නෙවී කියලයි සුමේධා කිව්වේ."

"දරුවගේ අනික් ප්‍රශ්ණය තමයි කකුල් පණ නැතිවෙලා තියෙන එක. කොඳු ඇට පෙළින් එළියට ආව ස්නායුවක් පොඩි කාලෙදි ශල්‍යකර්මයකින් ඉවත් කරලා. ඊට පස්සෙ තමයි එහෙම වෙලා තියෙන්නෙ. ඒ කියන්නෙ කකුල්වලට සම්බන්ධ ස්නායුවක් නිසා වෙන්න ඇතිනේ.

සුමේධලා හිතාගෙන ඉන්නේ පුංචියට ගෙයක්, වැසිකිලියක් එහෙම හදලා දීලා රෝද පුටුවක් එහෙමත් යවන්න. ඉතිං ඔය දේවල්වලට මුදල් එකතු කරන්න. ඉතිං ඔය දේවල්වලට මුදල් එකතු කරන්න. ''ආප්ප රාත්‍රියවල්'' එහෙමත් සංවිධානය කරන්නයි බලාපොරොත්තුව.

''ඇත්තටම මේ දේ ගැන ගොඩක් අය උනන්දුයි. උදව් කරන්න කැමති අයට මේ අංකවලට කතා කරන්න කියලා සුමේධා කිව්වා.

සුමේධා	0423 688 482
තේජා	0434 165 507
රසිකා	0403 303 585
නයනා	0425 787 484

හොඳ පින් අතේ වැඩක්. තමන්ගේ දරුවන්ට පවා පින් අයිතිවෙන හොඳ

මනුස්සකම

වැඩක්ෂා පැන් කතාව ඉවර කරලා ලොකු හුස්මක් ඇරියා.

''එක එක මගඩි කරලා තමුන්ගෙ සාක්කු පුරවාගන්න තරගකරන මිනිස්සු අතරේ මේ වාගේ තමුන්ට පුළුවන් හැටියට ලංකාවේ ඉන්න අසරණ අයට පිහිටවෙන අය හරියටවත් අපි අතරෙ ඉන්නවා. ඒ අයට ප්‍රසිද්ධිය ඕන නෑ. නමක්වත් හරියකට පත්තරේකට, රේඩියෝ එකකට කියන්න ඕනකමකුත් නෑ. එක එක සංවිධානවල තනතුරු පස්සෙ යන්නෙත් නෑ. එක එක සංවිධානවල තනතුරු පස්සෙ යන්නෙත් නෑ. මේ හැම දේකටම මුල් වෙන්නේ තමුන්ගෙ හිතේ තියෙන මනුස්සකම..... පන් තමුන්ගෙ අදහස් වක්කඩ කැඩ-වා කැඩුවා වගේ කියාගෙන කියාගෙන ගියා.

''තමන්ගේ උවමනාවලට දහ දොළොස් පාර කතා තරන අයට වැඩේ කෙරුනට පස්සේ 'ස්තූතියි'' කියන්නවත් මතක නෑ කියලා ජගතුත් නිතරම කියන කතාවක්. '' පින් ඒ මතක් කලේ ජගත් ජේ. එදිරිසිංහ මහත්තයාගේ තකාවක්.

''කාරිය කෙරෙන තුරු කාගෙත් රැවටිල්ල'' කියනවනේ හැම දේකටම මනුස්සතම තමයි මුල් වෙන්නෙ. නැත්තං අපේ වැඩ පොළවල්වලදී දවසකට කීවතාවක් නම් ''තැන්ක් යූ'' කියනවද? පැන් ඒ කතාවලට අලගු කිව්වෙ එහෙම.

'' අපි මේ ලෝකෙට පාදුර්භූත වෙන්නෙ මිනිස් පැටව් හැටියට ඊට පස්සෙයි ලොකු මහත්තුරු, කලාකාරයෝ වෙන්නෙ. මිනිස් පැටව් හැටියහට අපි '' මනුස්සකම'' කයනදේ මිට මෙලෙවාගෙන උපදින්නෙ හරියට මහෞෂධ පණ්ඩිතයෝ සඳුන් පරක් මිටින් අරගෙන උපන්නා වගේ. ඒත් ඒ මෙළවිච්ච මෘදු අත් දිගහැරිල හයිය හත්තිය ලැබුණම මොකද වෙන්නෙ ? මො-නවද ඒ අත්වලින් කරන්නෙ?

පන්හිඳ තමුන් ලියපු සින්දුවක අදහස කියවන්න ගත්තා සින්දුවට තාලෙදාලා සංගීතය යෙදුවෙ ආචාර්ය වික්ටර් රත්නායක මහත්තයා. ගායනා කලේ සුනිල් එදිරිසිංහ ප්‍රවීණ ගායක මහත්තයා.

''මේ මන්දාකිණියේ
වේද වෙනයම් මහිමයක්?
මිනිස්කම රදනා
මිනිස් වග හා සසඳලන්නට
වේද වෙන යම් අරුමයක්?

කළලයයක්සේ කුසේ පිළිසිඳිලා
සියක් වසනා ලොවට වඩනා
මිනිස්කම අගනා
මිටින් හරිනුයෙ කිමැයි අත සවිදා?
මිනිසුනේ
ගනිමු දෝතින් මිනිස්කම්

මුදු මොළොක් වූ දෑත් රළු වීලා
නිදන් සොයනා තරග වදිනා
මිනිස් බිළියදිනා
ලෙයින් දොවනුයෙ කිමැයි සත දියතේ?
මිනිසුනේ
ගනිමු අතිනත් සෙනෙහසින්

කළලයක් වාගේ මව් කුසයක පිළිසිඳගන්න මිනිස්කමයි නෑ සියන් ඉන්න ලෝකයට වඩමවන්නෙ. ඉතින් අතපය සවිමත් වෙනදාට ඒ මිනිස්කම අත අරින එක නෙ-වෙයි. වෙන්න ඕන. දෝතින්ම රැකගන්න එකයි. ඕන කරන්නෙ. ඒත් සමහර වෙලාවට වෙන්නෙ ඒකේ අනික් පැත්ත. කීර්තිය ධන නිධාන හොයාගෙන තරග වැදිලා ඉන්න සමහරෙකුට ඒ වෙනුවෙන් මනුස්සකම නෙවෙයි. මිනිස්සුන්ව පවා බිළිගන්න පුළුවන් ලෝක ෂත්වයින් ලෙසින් නාවනවා වෙනුවට අර දැඩි වුන අත් අරන් සෙනෙහසින් එකමුතු වෙන එකනෙ වෙන්න ඕන. පන් තමන්ගේ අදහස කියලා ඉවර කළේ එහෙම.
මේ විශ්වයේම, මන්දාකිණියේම මිනිස් වර්ගයා වාගේ මහිමයක් තියෙයිද? මනුස-සකම රැදිලා තියෙන්නෙ මනුස්සයින් ඇත්තටම අරුමයක් නෙවෙයිද? '' පිං අහනවා''

''එහෙම පිරිසකුත් ඉන්නවා අපි අතරෙ. කළෙහි ගුණ දන්න, හොඳදේ අගය කරන්න දන්න, හොඳදේ වෙනුවෙන් කැපවෙලා ඉන්න අය නැත්තෙම නෑ මනුස්සකම ඉතිරිවෙලා තියෙන්නෙ ඒඅ ය අතෙයි. ඒ මනුස්සකමේ මහිමයෙන් තමයි සුමේධලාට තේරිලාට මේ වගේ හොඳ අදහස් පහළ වෙන්නෙ පැන් කුස්සිය පැත්තට ගියා කියාගෙන එහෙම.

මේ මොහොත රටට පිළිබඳ ඉතාම වැදගත් අවස්ථාවක්. අපි එක්සත් ජාතික පක්ෂයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෝ නොවෙයි. වෙනත් කිසිම දේශපාලන පක්ෂයක සාමාජිකයෝ නො-වෙයි. නමුත් මේ ගිවිසුම අස්සන් කිරීමට එක්වෙනවා සියලුම පක්ෂවල අය. සියලුම ආගම්වල අය. සියලුම ජාතීන්වල අය. සංවිධාන වශයෙන් 110ක් දැනට එකට එක්වී සිටිනවා. ඒ අපේ මාතෘ භූමිය වෙනුවෙන්. ඒ සඳහා කිසිම භේදයක් නැතිව සියලු දෙනාම එකට සන්ධානගතවීමක් අද මේ සිදුව තිබෙන්නේ.

එදා සාදාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරයක් ආරම්භ කරලා, ඒක ව්‍යාප්ත කළා සාදාරණ සමාජයක් උදෙසා ගොවියෝ, සාදාරණ සමාජයක් උදෙසා වෛද-‍යවරු, සාදාරණ සමාජයක් උදෙසා විශ්‍රාමිකයෝ වශයෙන් විවිධ ආකාරයට. මේ සංවිධානය පෙනී සිටියේ සාදාරණය සහ යුක්තිය වෙනුවෙන්. ඒ සඳහා රටේ සෑම දෙනාම පොදු වැඩපිළිවෙළක් සාදාගත්තා. ඒ පොදු වැඩපිළිවෙළ අපි ඉස්සෙල්ලම ඉදිරිපත් කළා හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න. අලුත් මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දෙන්න. 17 වෙනි සංශෝධනය ක්‍රියාත්මක කරන්න කියලයි අපි ඉල්ලුවේ. ඒකට එතුමා ක්‍රියා නොකළ නිසා අපි ජනාධිපතිවරණයට පොදු අපේක්ෂකයෙක් ඉදිරිපත් කරන්න තීරණය කළා. ඒ පොදු අපේක්ෂකයාට තිබුණේ පොදු වැඩපිළිවෙළක්. මේ රට තමන්ගේ අනසකට යටත් කරගත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමයි එහි මුලටම තිබුණේ. විධායක ජනාධිපති ක්‍රමය රටේ සියල්ල ගිල දැම්මේ පිඹුරෙක් ගිලිනවා වගේ.

ඒ වගේම 18 වෙනි සංශෝධනය මගින් පොලිසිය නීතිය, අල්ලස් හෝ දූෂණ කොමිසම, ආදී සියල්ල තම ආධිපත්‍යයට නතු කරගෙනයි හිටියේ. මේ ජරාජීර්ණ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමත් පොදු අපේක්ෂකයාගෙන් කරගැනීමට අපේක්ෂා කළා. මේ මැතිවරණ ක්‍රමය තව අවුරුදු 10ක් තිබුණොත් මුළු පාර්ලිමේන්තුවේම ඉන්නේ කැසිනෝකාරයෝ, කුඩුකාරයෝ, ස්ත්‍රී දූෂකයෝ, ළමා අපරා-ධකාරයෝ, මංකොල්ලකාරයෝ, පාතලයෝ.

මේ රටට නීති හදන තැන. ප්‍රතිපත්ති හදන තැන. කැසි-නෝකාරයෝ කුඩුකාරයො, ස්ත්‍රී දූෂකයෝ, ළමා අපරාධක-ාරයෝ, මංකොල්ලකාරයෝ, පාතලයන් පාර්ලිමේන්තුවට පත්කරගෙන අපි මොකක්ද බලාපොරොත්තු වෙන්නේ? ඒ නිසා මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න ඕනේ.

මේ ප්‍රධාන කාරණාවලට ආරම්භයක් දුන්නා. 19 වෙනි සං-ශෝධනය හරියට කරගන්න බැරවුණා. යන්තමින් සම්මත වුණා. ඒ යන්තම් සම්මතවීමත් වටිනවා. දැන් අවුරුදු හතරහමාරක් යනකම් පාර්ලිමේන්තුව විසුරුවන්න බැහැ. ජනාධිපතිවරයා නීතියට යටත්. 17 වෙනි සංශෝධනය ක්‍රියාවට නැගීම ආරම්භ කර තිබෙනවා. නමුත් විධායක සභාව පත්කරගන්න බැරිවුණා. 20 වෙනි සංශෝධනය සම්මත කරගන්න බැරිවුණා. එහෙත් දිනාගත්ත යම් අයිතිවාසිකම් ප්‍රමාණයකුත් තිබෙනවා.

මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරනවාට මන්ත්‍රීවරුනුත් කැමති නෑ. ඔවුන්ට මේකට විරුද්ධ වෙන්නත් බෑ. තමන්ගේ පැත්තෙන් බැලුවම විරුද්ධ නොවීත් බෑ. බැරිවෙලාවත් ඊළඟ ඡන්දයේදී සමාන ගානක් දෙපැත්තට ආවොත් මන්ත්‍රීකම හොඳ ගානකට විකුණගන්න පුලුවන්. කෝටියයි. දෙකයි. අෑවරයි. දෑවරුයි. තුන්කෝටියයි. කියලා විකුණන්න පුලුවන්. ඉතිං කවුද කැමති වෙන්නේ ඒක නැතිකරගන්න.

නමුත් අපි ජනවාරි 8වෙනිදා යන්නට ආරම්භ කළ ගමනේ තව යන්නට හුගාක් දුර තිබෙනවා. ආපසු හැරෙන්නට බැහැ. එදා මේ ගමනට අපිත් එක්ක එකතුව හිටියේ සංවිධාන 48යි. අද මේ වන විට 110ක් එකතුවී සිටිනවා. තව එකතුවෙනවා. රටම එකතුවෙනවා පොදු ප්‍රතිපත්තියක් ජයග්‍රහණය කරවන්නට.

අග්‍රාමාත්‍ය තුමනි. මේ සැරේ මැතිවරණයෙන් පස්සේ අපි බලාපොරොත්තු වන්නේ තට්ටු මාරු ක්‍රමයේ වෙනසක් නෙ-වෙයි. ඊට වඩා ලොකු වෙනසක් අපේක්ෂා කරගෙන තමයි අද මේ සංවිධාන 110ක් ගිවිසුමක් අස්සන් කළේ. ඒ සියලු දෙනාට අපි වගකියන්න ඕනේ. ඔබතුමාලා බලයට පත්වෙලා කළ යුත්තේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම විතරක් නොවෙයි.

සන්නස Cartoon by PK